JMC vLearning
"your virtual learning partner"

2021 ජනවාරි විභාග ප්‍රශ්න පත්‍රය

AAT අදියර III

MAF - කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය

Paper Pack

උපුල් අබේසූරිය
B.Sc. (B.Admin) Sp., FCA, FCMA

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

සියලු ම හිමිකම් ඇවිරිණි.

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර III විභාගය - 2021 ජනවාරි

(302) කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය

(Management Accounting & Finance)

2021-03-21
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
  උත්තර ලිවීම සඳහා - පැය 03 යි.
  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  (6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  (7) ***ගණිතමය වගු** සපයනු ලැබේ.*
  (8) *ලකුණු 100.*

A කොටස

(මුළු ලකුණු 20)

01 වන ප්‍රශ්නය

(a) කළමනාකරණ තීරණ ගැනීමේ අරමුණු වෙනුවෙන් සංවිධානයක ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර පරිශීලකයන්ගේ භාවිතය සඳහා මූල්‍ය වාර්තා සහ තොරතුරු පිළියෙළ කිරීම කළමනාකරණ ගිණුම්කරණයේ ඇතුළත් වේ.

ඔබ විසින් කළ යුතු දෑ:

"කළමනාකරණ ගිණුම්කරණය" (Management Accounting) සහ "මූල්‍ය ගිණුම්කරණය" (Financial Accounting) අතර වෙනස්කම් දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(b) **සීමාසහිත CX සමාගම, CX1 නිෂ්පාදිතය** නිපදවා විකිණීම සිදුකරයි. **CX1 නිෂ්පාදිතය** සඳහා 2021 අප්‍රේල් මාසයට අදාළව පහත සඳහන් තොරතුරු සපයා තිබේ:

	රු.
ඒකකයක විකුණුම් මිල	130
ඒකකයක විචල්‍ය පිරිවැය	98
මාසික ස්ථාවර පොදුකාර්ය	94,720

මාසයක අයවැයගත විකුණුම් ප්‍රමාණය ඒකක 3,800 කි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ **ගණනය කරන්න:**

(i) සමච්ඡේද ලක්ෂ්‍යය, ඒකකවලින් [Break Even Point (BEP) in units].

(ii) අයවැයගත විකුණුම් ප්‍රමාණයේදී මාසය සඳහා අපේක්ෂිත ලාභය. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

02 වන ප්‍රශ්නය

සීමාසහිත MKT සමාගම, කුඩා සුපිරි වෙළෙඳසැල් ජාලයක් පවත්වාගෙන යන අතර, පහත සඳහන් තොරතුරු 2020 මාර්තු 31 දිනෙන් සහ 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගෙන තිබේ:

	2019/20 (රු.)	2018/19 (රු.)
විකුණුම්	6,022,500	5,746,000
තොගය	944,800	925,200
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	891,700	813,300

2019/20 වර්ෂය සඳහා වෙළෙඳ ලැබිය යුතු මුදල් එකතුකිරීමේ කාලය සහ දළ ලාභ අනුපාතය, පිළිවෙලින්, දින 53 ක් සහ 20% ක් විය.

සියලු විකුණුම් ණය පදනම මත සිදුකරනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

2019/20 වර්ෂය සඳහා **සීමාසහිත MKT සමාගමේ** කාරක ප්‍රාග්ධන චක්‍රයේ දිග (length of the working capital cycle) **ගණනය කරන්න**. (ලකුණු 05)

03 වන ප්‍රශ්නය

සීමාසහිත පැනල්ස් සමාගම, ගෘහ සැරසිලි කිරීමේදී භාවිත කිරීම සඳහා කැටයම් ලෑලි නිෂ්පාදනය කර විකිණීම සිදුකරයි. සමාගම, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකක 11,000 ක් නිෂ්පාදනය කර විකිණීමට අයවැයගතකර ඇත. කොවිඩ්-19 (COVID-19) වසංගත තත්ත්වය නිසා සමාගම, එම විකුණුම් ඉලක්කය සපුරා ගැනීමට අසමත් වූ අතර, ඒකක 5,800 ක් පමණක් ළඟා කර ගත්තේය.

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි:

	අයවැයගත (රු.)	සත්‍ය (රු.)
විකුණුම්	7,150,000	4,200,000
සෘජු ද්‍රව්‍ය	(3,256,000)	(2,368,000)
සෘජු ශ්‍රමය	(1,745,000)	(910,000)
විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය	(913,000)	(364,000)
ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය	(268,000)	(168,000)
ස්ථාවර බෙදාහැරීමේ වියදම්	(283,000)	(283,000)
ලාභය	**685,000**	**107,000**

වර්ෂය ආරම්භයේදී සහ වර්ෂය අවසානයේදී තොග කිසිවක් නොතිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නම්‍ය අයවැය (මෙහෙයුම් ප්‍රකාශනය) **පිළියෙල කරන්න**. (ලකුණු 05)

04 වන ප්‍රශ්නය

සීමාසහිත එපික් සමාගමට, ඒකකයක් රු.400/- බැගින් වන නව නිෂ්පාදිතයකින් ඒකක 48,000 ක් සැපයීම සඳහා ගනුදෙනුකරුවෙකුගෙන් විශේෂ ඇණවුමක් ලැබුණි. ඒ පිළිබඳ පහත සඳහන් තොරතුරු සපයා තිබේ:

(1) මෙම ඇණවුම ලැබීමට පෙර, රු.450,000/- ක පිරිවැයක් දරා උපදේශකවරයෙකු මඟින් එම නව නිෂ්පාදිතය පිළිබඳව පර්යේෂණයක් සිදුකරන ලදී.

(2) ඒකකයක සෘජු අමුද්‍රව්‍ය පිරිවැය රු.210/- ක් බැගින් වන අතර, මෙම අමුද්‍රව්‍ය මේ වන විට සමාගම විසින් භාවිත නොකරන බැවින් එම අමුද්‍රව්‍ය වෙළෙඳපොළෙන් සපයාගත යුතු වේ.

(3) දැනට සිටින සේවකයින් විසින්ම නිෂ්පාදන ක්‍රියාවලිය සිදුකරන්නේ නම්, ඒකකයක ශ්‍රම පිරිවැය රු.180/- බැගින් වනු ඇත. කෙසේවෙතත්, ඒකක 48,000 නිෂ්පාදනය කිරීම සඳහා රු.8,475,000/- ක පිරිවැයකට බාහිර පාර්ශවයකට නිෂ්පාදන ක්‍රියාවලිය බාහිර මූලාශ්‍රගත (outsourcing) කිරීමේ හැකියාවක් ද පවතී.

(4) මෙම ඇණවුම බාරගන්නේ නම්, ඒකකයකට රු.45/- බැගින් වූ වෙනත් විචල්‍ය පොදුකාර්ය වියදමක් දැරිය යුතු වේ.

(5) සමාගම මෙම ඇණවුම බාරගන්නේ නම්, දැනට නිපදවනු ලබන නිෂ්පාදිතයක, නිෂ්පාදන කටයුතු කල්දැමීමට සිදුවන අතර, කල් දැමීමේ කාලය තුළදී එම නිෂ්පාදිතය මත රු.1,250,000/- ක මූල්‍යමය ප්‍රතිලාභයක් ලැබීමට අපේක්ෂිතය.

ඔබ විසින් කළ යුතු දෑ:

සමාගම, මෙම ඇණවුම පිළිගත යුතුදැයි **තක්සේරු කරන්න** *(ඔබේ උත්තරය ගණනය කිරීම් මඟින් සනාථ කරන්න).*

(ලකුණු 05)

A කොටසෙහි අවසානය

B කොටස

(මුළු ලකුණු 30)

05 වන ප්‍රශ්නය

සීමාසහිත ෆුඩ්ස් සමාගම, තෝරාගැනීම සඳහා විවිධ වර්ග 8 කින් යුතු දහවල් ආහාර, කාර්යාල සේවකයන් සඳහා පිළියෙල කර විකිණීම සිදුකරයි. ඇණවුම් කිරීම මාසික පදනමින් හෝ දෛනික පදනමින් සිදු කළ හැක. මුළු මාසික විකුණුම්වලින් 20% කට සමානවන දෛනික ඇණවුම්, මුදල් පදනමින් සිදුකරනු ලබයි. මාසික පදනමින් ඇණවුම් ලබාදීමේදී පාරිභෝගිකයන් 10% ක වට්ටමකට හිමිකම් ලබන අතර, එම ගනුදෙනුකරුවන්ගේ මුදල් ඊළඟ මාසයේදී එකතු කරගනු ලැබේ.

අමුද්‍රව්‍ය මාසික පදනමින් මිලට ගනු ලබයි. සැපයුම තහවුරු කිරීම සඳහා යම් මාසයක් සඳහා ඇස්තමේන්තුගත අමුද්‍රව්‍ය පිරිවැයෙන් 25% ක අත්තිකාරම් මුදලක් පෙර මාසයේ අවසානයේදී සමාගම සිදුකරනු ලබන අතර, ඉතිරි මුදල මිලදී ගැනීම සිදුකළ මාසයේදී කරනු ලබයි. දහවල් ආහාර ඇසුරුම් කිරීම සහ බෙදාහැරීම දින 60 ක ණය කාලසීමාවක් සහිතව බාහිර පාර්ශවයක් විසින් සිදුකරනු ලබයි.

කාර්යමණ්ඩල වැටුප්, එක් එක් මාසය අවසානයේදී ගෙවනු ලබන අතර, වැටුපෙන් 15% කට සමාන දිරි දීමනාවක් ඊළඟ මාසයේදී ගෙවනු ලබයි.

විදුලිය, ජලය සහ දුරකතන බිල්පත් ඒවා දරණ ලද මාසයට පසු මාසයේදී ගෙවනු ලබයි. මුළුතැන්ගෙය සහිත ගොඩනැගිල්ල සඳහා කුලිය මාසයකට රු.50,000/- බැගින් වන නමුත් එය කාර්තුමය පදනමින්, කාර්තුවක් අවසන් වී එළඹෙන ඊළඟ මාසයේදී ගෙවනු ලබයි.

2021 වර්ෂයේ පෙබරවාරි, මාර්තු, අප්‍රේල්, මැයි, ජූනි සහ ජූලි මාස සඳහා මෙහෙයුම් අයවැය පහත දැක්වේ:

(රු.)

	පෙබරවාරි	**මාර්තු**	**අප්‍රේල්**	**මැයි**	**ජූනි**	**ජූලි**
විකුණුම්	1,800,000	1,900,000	1,200,000	1,800,000	2,000,000	2,100,000
අමුද්‍රව්‍ය	1,080,000	1,140,000	720,000	1,080,000	1,200,000	1,260,000
ඇසුරුම් හා බෙදාහැරීම	252,000	266,000	168,000	252,000	280,000	294,000
කාර්යමණ්ඩල වැටුප් (දිරි දීමනා රහිතව)	144,000	144,000	144,000	144,000	144,000	144,000
විදුලිය, ජලය හා දුරකතන	18,000	18,000	12,000	18,000	18,000	18,000

2021 අප්‍රේල් 01 දිනට, **සීමාසහිත ෆුඩ්ස් සමාගමෙහි** මුදල් ශේෂය රු.180,000/- ක් වේ යැයි අපේක්ෂා කෙරේ.

ඔබ විසින් කළ යුතු දෑ:

2021 වර්ෂයේ අප්‍රේල්, මැයි සහ ජූනි මාස සඳහා මුදල් අයවැය **පිළියෙල කරන්න**. (ලකුණු 10)

06 වන ප්‍රශ්නය

සීමාසහිත ස්පීඩ් සමාගම, SX1, SX2 සහ **SX3** නමින් රථවාහන කර්මාන්තයේදී භාවිතවන උපාංග (components) තුනක් නිෂ්පාදනය කර විකිණීමේ යෙදී සිටියි.

2021 අප්‍රේල් මාසය සඳහා උපාංග තුන පිළිබඳ පහත සඳහන් තොරතුරු සපයා තිබේ:

	රු. (ඒකකයක් සඳහා)		
	SX1	**SX2**	**SX3**
සෘජු අමුද්‍රව්‍ය	2,800	3,400	3,100
පුහුණු ශ්‍රමය - A ශ්‍රේණිය (පැයකට රු.550/- බැගින්)	1,100	1,375	1,650
පුහුණු ශ්‍රමය - B ශ්‍රේණිය (පැයකට රු.420/- බැගින්)	1,680	1,260	1,470
නුපුහුණු ශ්‍රමය (පැයකට රු.180/- බැගින්)	1,080	990	720
විචල්‍ය පොදුකාර්ය	2,000	2,000	1,880
විකුණුම් මිල	12,400	14,000	12,900

මාසික අයවැයගත විකුණුම් ඒකක	1,000	1,500	800

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2021 අප්‍රේල් මාසය සඳහා ලබාගත හැකි උපරිම ශ්‍රමය පහත සඳහන් පරිදි ඇස්තමේන්තුගත කර ඇත:

පුහුණු ශ්‍රමය - A ශ්‍රේණිය	පැය 8,300
පුහුණු ශ්‍රමය - B ශ්‍රේණිය	පැය 11,000
නුපුහුණු ශ්‍රමය	පැය 20,000

ඔබ විසින් කළ යුතු දෑ:

(a) සීමාකාරී සාධක / සාධකය **හඳුනා දක්වන්න.** (ලකුණු 05)

(b) හඳුනාගත් සීමාකාරී සම්පත / සම්පත් පදනම් කරගනිමින් ප්‍රශස්ත නිෂ්පාදන මිශ්‍රය **ගණනය කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

07 වන ප්‍රශ්නය

සීමාසහිත LST පොදු සමාගම, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමකි. සමාගම පිළිබඳ පහත සඳහන් තොරතුරු සපයා තිබේ:

(1) සමාගම ආරම්භයේදී කොටසක් රු.10/- බැගින් නිකුත් කළ ඡන්ද හිමි සාමාන්‍ය කොටස් මිලියන 40 ක් **සීමාසහිත LST පොදු සමාගමේ** නිකුතුවේ තිබේ. පසුගිය වර්ෂය සඳහා කොටසකට රු.1.20 බැගින් ලාභාංශයක් ගෙවන ලද අතර, වාර්ෂිකව 8% බැගින් ලාභාංශ වර්ධනය වේයැයි අපේක්ෂා කරයි. ඡන්ද හිමි සාමාන්‍ය කොටසක වර්තමාන වෙළෙඳපොළ මිල රු.18/- කි.

(2) කොටසක් රු.10/- බැගින් නිකුත් කරන ලද, නිදහස් කළ නොහැකි වරණීය කොටස් 6,000,000 ක් ද සමාගම සතු වේ. වරණීය කොටස් සඳහා වාර්ෂික ලාභාංශය කොටසකට රු.1.50 ක් බැගින් වන අතර, වරණීය කොටසක වෙළෙඳපොළ මිල රු.12/- ක් විය.

(3) වාර්ෂිකව 12% ක කූපන් (coupon) අනුපාතිකයක් සහිතව එකක් රු.100/- බැගින් ලැයිස්තුගත ණයකර 5,000,000 ක් සමාගම නිකුත් කර ඇත. ණයකර වර්ෂ 3 කින් නිදහස් කරනු ලබන අතර, ණයකරයක වර්තමාන වෙළෙඳපොළ මිල රු.95/- බැගින් විය.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) ඡන්ද හිමි සාමාන්‍ය කොටස් පිරිවැය. (ලකුණු 02)

(b) නිදහස් කළ නොහැකි වරණීය කොටස් පිරිවැය. (ලකුණු 02)

(c) නිදහස් කළ හැකි ණයකර පිරිවැය. (ලකුණු 03)

(d) වෙළෙඳපොළ අගය භාවිතයෙන් බරතැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය [Weighted Average Cost of Capital (WACC)]. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

C කොටස

(මුළු ලකුණු 50)

08 වන ප්‍රශ්නය

සීමාසහිත DRL සමාගම, T නිෂ්පාදිතය නිෂ්පාදනය කර විකුණනු ලබයි. පහත සඳහන් තොරතුරු **T නිෂ්පාදිතයේ** ප්‍රමිත පිරිවැය පත්‍රිකාවෙන් උපුටා ගන්නා ලදී:

	ඒකකයකට (රු.)
සෘජු අමුද්‍රව්‍ය (කිලෝග්‍රෑමයකට රු.65/- බැගින් කිලෝග්‍රෑම් 8 ක්)	520
සෘජු ශ්‍රමය:	
පුහුණු ශ්‍රමය (පැයකට රු.380/- බැගින් මිනිත්තු 15)	95
නුපුහුණු ශ්‍රමය (පැයකට රු.200/- බැගින් පැය 1)	200
විචල්‍ය පොදුකාර්ය (පැයකට රු.140/- බැගින් පැය 1.25)	175
මුළු විචල්‍ය පිරිවැය	990
විකුණුම් මිල	1,400
දායකය	**410**

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා අයවැයගත විකුණුම් / නිෂ්පාදනය, ඒකක 5,000 කි.

පහත සඳහන් සත්‍ය තොරතුරු 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ආදායම් ප්‍රකාශයෙන් උපුටාගෙන තිබේ:

සත්‍ය විකුණුම් / නිෂ්පාදනය		ඒකක 4,760
විකුණුම් අයභාරය	(රු.)	6,473,600
සෘජු ශ්‍රම පිරිවැය:		
පුහුණු ශ්‍රමය (පැයකට රු.390/- බැගින් පැය 1,130)	(රු.)	440,700
නුපුහුණු ශ්‍රමය (පැයකට රු.180/- බැගින් පැය 4,950)	(රු.)	891,000
විචල්‍ය පොදුකාර්ය	(රු.)	863,360

ඉහත කාලපරිච්ඡේදය සඳහා පහත විචලනයන් ගණනය කරන ලදී:

විචලනය	අගය
සෘජු ද්‍රව්‍ය මිල විචලනය	රු.361,760/- අවාසි
සෘජු ද්‍රව්‍ය භාවිත විචලනය	රු.123,760/- වාසි
ශ්‍රම අනුපාත විචලනය	රු.87,700/- වාසි
විචල්‍ය පොදුකාර්ය වියදම් විචලනය	රු.12,160/- අවාසි
විචල්‍ය පොදුකාර්ය කාර්යක්ෂමතා විචලනය	රු.18,200/- අවාසි
විකුණුම් ආන්තික පරිමා විචලනය	රු.98,400/- අවාසි
විකුණුම් මිල විචලනය	රු.190,400/- අවාසි

ඔබ විසින් කළ යුතු දෑ:

(a) කාර්තුව සඳහා භාවිත කළ සත්‍ය සෘජු ද්‍රව්‍ය කිලෝග්‍රෑම් ගණන **ගණනය කරන්න**. (ලකුණු 02)

(b) පහත සඳහන් විචලනයන් **ගණනය කරන්න**:

(i) සෘජු ශ්‍රම මිශ්‍රණ විචලනය (Labour Mix Variance). (ලකුණු 04)

(ii) සෘජු ශ්‍රම ඵලදායිතා විචලනය [Direct Labour Yield (Productivity) Variance]. (ලකුණු 04)

(c) අයවැයගත දායකය, සත්‍ය දායකය සමඟ සැසඳීම සඳහා මෙහෙයුම් ප්‍රකාශයක් **පිළියෙල කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 15)

09 වන ප්‍රශ්නය

සෞඛ්‍ය සේවා සැපයුම්කරුවෙකු වන **සීමාසහිත කෙයා සමාගම,** රු. මිලියන 120 ක පිරිවැයකට වෛද්‍ය පරීක්ෂණ යන්ත්‍රයක් මිලදී ගැනීම සම්බන්ධ නව ව්‍යාපෘතියක ශක්‍යතාව තක්සේරු කරමින් සිටී.

යන්ත්‍රය මිලට ගන්නේ නම්, එක් පරීක්ෂණයක් වෙනුවෙන් සෘජු ද්‍රව්‍ය සඳහා රු.540/- ක් ද, සෘජු ශ්‍රමය සඳහා රු.320/- ක් ද, විචල්‍ය පොදුකාර්ය සඳහා රු.100/- ක් ද, වශයෙන් පිරිවැය ඇස්තමේන්තුගත කර ඇත. සමාගම, එක් පරීක්ෂණයක් වෙනුවෙන් රු.2,000/- බැගින් රෝගීන්ගෙන් අය කිරීමට අපේක්ෂා කෙරේ.

ඉදිරි වර්ෂ 5 සඳහා පරීක්ෂණ සඳහා ඇති ඉල්ලුම පහත පරිදි වේයැයි සමාගම අපේක්ෂා කෙරේ:

වර්ෂය	පරීක්ෂණ ගණන
1	50,000
2	50,000
3	54,000
4	56,000
5	38,000

වාර්ෂික ස්ථාවර පොදුකාර්ය රු. මිලියන 30 ක් වේයැයි ඇස්තමේන්තුගතකර තිබෙන අතර, එහි වර්ෂ 5 ක ඵලදායී ජීව කාලය පුරා සරල මාර්ග ක්‍රමයට ගණනය කළ පරීක්ෂණ යන්ත්‍රයේ ක්ෂය ඇතුළත් වේ.

සීමාසහිත කෙයා සමාගම, වාර්ෂිකව 28% ක අනුපාතය යටතේ ආදායම් බදු ගෙවන අතර, එය එම වර්ෂයේදීම ගෙවිය යුතු වේ. සමාගම, නව යන්ත්‍රය සඳහා 25% අනුපාතය යටතේ ප්‍රාග්ධන දීමනා අඩු කිරීමට හිමිකම් කියනු ලැබේ.

සීමාසහිත කෙයා සමාගමේ ප්‍රාග්ධන පිරිවැය වර්ෂයකට 15% කි.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය [Net Present Value (NPV)] **ගණනය කරන්න.** (ලකුණු 13)

(b) ඉහත ගණනය කළ ශුද්ධ වර්තමාන අගය පදනම් කර ගනිමින්, ඉහත ව්‍යාපෘතියේ ශක්‍යතාවය (viability) **තක්සේරු කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 15)

10 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත PRC සමාගම,** අඛණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියක් හරහා **X නිෂ්පාදිතය**, නිෂ්පාදනය කර විකුණනු ලබයි. එහිදී නිෂ්පාදිතය සම්පූර්ණ වන තුරු එක් පෙරසැරියකින් ඊළඟ පෙරසැරියට නිෂ්පාදිත මාරු කරනු ලැබේ.

I වන පෙරසැරිය සම්බන්ධව 2020 දෙසැම්බර් මාසය සඳහා පහත තොරතුරු සපයා තිබේ:

සෘජු ද්‍රව්‍ය (කිලෝග්‍රෑම් 10,400)	රු.1,310,920
සෘජු ශ්‍රමය	රු.742,560
විචල්‍ය පොදුකාර්ය	රු.283,960
II වන පෙරසැරියට මාරුකළ නිමැවුම	කිලෝග්‍රෑම් 7,620
සාමාන්‍ය අපතය	සෘජු ද්‍රව්‍ය යෙදවුම්වලින් 5% වන අතර මෙය කිලෝග්‍රෑමයක් රු.70/- බැගින් විකිණිය හැකිවේ.

මාසය අවසානයේදී කිලෝග්‍රෑම් 1,800 ක අවසාන නොනිමි වැඩ තොගයක් පැවති අතර, සම්පූර්ණ කිරීමේ මට්ටම පහත පරිදි විය:

සෘජු ද්‍රව්‍ය	:	100%
සෘජු ශ්‍රමය	:	80%
විචල්‍ය පොදුකාර්ය	:	60%

ඔබ විසින් කළ යුතු දෑ:

සමානුපාතික ඒකක හා පිරිවැය දැක්වෙන ප්‍රකාශනය සහ **පෙරසැරි I** ගිණුම **පිළියෙල කරන්න.** (ලකුණු 13)

(B) **සීමාසහිත NEX සමාගම,** නව සඟරාවක් එහි පාරිභෝගිකයන්ට හඳුන්වාදීම පිළිබඳව තක්සේරු කරමින් සිටියි. මෙය සාමාජික මුදලක් පදනම් වූ (subscription-based) අර්ධ වාර්ෂික (bi-annual) සඟරාවකි. සමාගම විසින් 80% ක සම්භාවිතාවක් සහිතව සඟරාව හඳුන්වාදීමට හැකි වෙතැයි අපේක්ෂා කරයි. සඟරාව හඳුන්වා දෙන්නේ නම්, ඉල්ලුම ඉහළ, මධ්‍යම හෝ පහළ වනු ඇති අතර, පිටපත් මිලියන 1 කට වඩා මුද්‍රණය කළහොත් විචල්‍ය නිෂ්පාදන පිරිවැය පිටපතකට රු.195/- බැගින් වන අතර, ඊට අඩු ප්‍රමාණයකදී පිටපතකට එය රු.240/- බැගින් වනු ඇත. පිටපතක විකුණුම් මිල රු.400/- බැගින් වේ.

විකුණුම් ප්‍රමාණය සහ එක් එක් ඉල්ලුම් මට්ටම සඳහා සම්භාවිතාව පහත දැක්වේ:

ඉල්ලුම	**විකුණුම් ප්‍රමාණය**	**සම්භාවිතාව**
ඉහළ	1,200	0.3
මධ්‍යම	800	0.4
පහළ	400	0.3

ඔබ විසින් කළ යුතු දෑ:

උපකාරක ගණනය කිරීම් ද සහිතව තීරණය ඇගයීම සඳහා තීරණ රුක (decision tree) **අඳින්න.** (ලකුණු 07)

(මුළු ලකුණු 20)

C කොටසෙහි අවසානය

කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
දැනුම (1)	තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම	අඳින්න	හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම.
		සම්බන්ධ කරන්න	තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම.
		සඳහන් කරන්න	ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම.
		හඳුනා දක්වන්න	සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම.
		ලැයිස්තුගත කරන්න	විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
අවබෝධය (2)	අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම.	හඳුනාගන්න	අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම.
		අර්ථකතනය කරන්න	වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න.
		විස්තර කරන්න	ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න.
		පැහැදිලි කරන්න	අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම.
		නිර්වචනය කරන්න	ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
භාවිතය (3)	අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම.	සසඳන්න	තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න.
		ප්‍රස්තාර දක්වන්න	ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න.
		තක්සේරු කරන්න	වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න.
		විසඳන්න	ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම.
		පිළියෙල කරන්න	විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම.
		ප්‍රදර්ශනය කරන්න	උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම.
		ගණනය කරන්න	ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම.
		භාවිත කරන්න	ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
විශ්ලේෂණය (4)	අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම.	සන්නිවේදනය කරන්න	තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම.
		සැකිල්ලක් සේ දක්වන්න	සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම.
		අසමානතා බලන්න	අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම.
		සමානකම් බලන්න	සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම.
		විමසන්න	තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම.
		වෙනස්කොට දක්වන්න	යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම.
		විශ්ලේෂණය කරන්න	විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න.